





# විදර්ශනා




අරුතක් මට වැටහෙන්නැති
සතුටක් මට නොම දැනෙනා
ජීවිතයේ අරුත සොයා
ජීවිතයේ මිහිර සොයා
අපමණ මං පෙත් ඔස්සේ
තැබූ පියවර මදකට නවතා
ඔබව සොයා ආවෙමි මම
ජීවිතයේ හුදෙකලාව
කලකිරීම
වෙහෙස - පවස
නිවාගන්න......

ආදරයක් සොයා ගන්න
සාදරයෙන් වැළඳ ගන්න
තනිකම හද දුරු කරන්න
වින්ද වේදනා අපමණ

නීල වර්ණ  ආකාසේ
ධවල වර්ණ වළාකුලේ
පැහැය මුළාවක් නම් කෙලෙසේ
මහද සොයන්නෙත් එයමද ... ?

මල් සුවඳක් හොරෙන් අරන්
රහසින් හමනා සුළඟක්
සැඟවී වන බඹරුන්ගෙන්
කොහි යන්නද හඬ නැතුවට ?

පළමුව එක දවසක්දා
යුග දෙනෙතක් හමු විලා
සෙව්වා සෙව්වා මොනවද
හංඟා හංඟා දෙහදක්
සැලුනා සැලුනා සිතිවිලි
පැටලී පැටලී පදවැල්

ලස්සන කන්දක සීතල
මුදුනට වී පද්මාසනයෙන්
අඬවන් වූ නෙතු සඟළින්
හාත්පසම ඇහිඳ ගතිමි

නිල්වන් නිල් ඈත වළලු
පෙනෙනා නොපෙනෙන මායිම
අරුත කියා පානා විට
ජීවිතයේ .....
සංසාරේ පුරුද්දකට
මුලු ගැන්වුනු සිත
කුළු ගන්නා විට
කම්පිත වේ විශ්වයක්ම
ඒ ස්වරයෙ
හඬ මා විය
හද සැනසින
සිත පිනවින
ලොව නැළවින
මා එහි විය
ඔබත් කැටුව
එහි යන්නට
මම එන්නෙමි
ඔබව සොයා....

හිතේ මගේ ලියවෙන කවි
ගයන්න පුළුවනි ඇහෙන්න
ගයනා කවි අසනා ඈ
සත්තයි තුටු වෙනවා

හිතේ මගේ නළියන වැකි
කියන්න පුළුවනි ඇහෙන්න
කියනා වැකි අසනා ඈ
සත්තයි හිනැහෙනවා

මට තනියක් දැන් කොයින්ද
දුක සෝකය කොහෙ ගිහින්ද
සැනසී මම නැළවෙමි ඈ
හද දොරමඬළාවේ

ඉර අවරට ගියාට පසු
නැග එන ඉරබටු තරුවේ
ලස්සන බලනා අතරේ
පවසමි පෙම් බස් රහසේ

මේඝදූතයේ රැඳි
කාලිදාසගේ කවි
කියමින් විඳිමින් ඈ හා
සඳපානේ මම යමි

මුහුදේ නිම් නැති රැළි
විලස නැගෙන සිතිවිලි
මෙතුවක් කල් සිරවුණි
මතු ඈ හා පවසමි

විවර කළෙමි දොරඟුළු
මෙතුවක් ලූ මුවඟුළු
ඇය හා වන්නට දොඩමලු
කුමටද රන් වන් සළු

ආදරයෙන් වැළඳ ගනිමි
නළල් තලය - අඩ සඳ විය
දෙබැම ඇගේ
ඈත අහසෙ තනිව සරන
සියොතෙක් වී
ලතාවකට

අඩවන් වූ නෙතු මත ඒ
මුව'ඟ තබා සිප ගත්තෙමි
ඇගේ වතේ ඇඳි දහසක්
රේඛාවෙන් සිතුවම් මවනෙමි
කන් පෙති මල්පෙති මෙන්
සිනිඳු සරින් පිරිමදිනෙමි
අඬවන් වූ නෙතු අතරින්
මගේ ළමැද වත හොවාන
ඔබ හෙළනා ගැඹුරු සුසුම්
ආශා පුපුදයි සැඟවුණු
නින්දෙන් අවදිව විගැහින්....

විරාමය ....

**සාමන්ත තැන්නගේ**